# අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා පුරප්පාඩුව පවත්නා හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා පත් කිරීමට ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු ලේඛනය සහ අයදුම්පත www.moj.gov.lk දරන අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.

මෙම තනතුර රජයේ වැටුප් ලබන ස්ථිර තනතුරක් නොවන අතර ගරු තනතුරක් වේ. මරණ පරීක්ෂකවරුන් සිය සේවය මරණ පරීක්ෂණ සිදු කරමින් ඉටු කිරීම වෙනුවෙන් රජයේ අනුමත ගාස්තුවක්ද, අනුමත ගමන් වියදම් / සංයුක්ත දීමනාද ගෙවනු ලැබේ.

පහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අමාත්‍යාංශ වෙබ් අඩවිය ඔස්සේ අදාළ මාර්ගගත (Online) අයදුම්පත හෝ අයදුම්පතේ දෘඩ පිටපතක් නිසි පරිදි සම්පූර්ණ කර 2026.02.05 දින හෝ ඊට පෙර අයදුම් කළ යුතුය.

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි අයෙකු විය යුතුය.

iii. පත්වීම් අපේක්ෂා කරන හදිසි මරණ පරීක්ෂක බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසමක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 27 ට නොඅඩු හා අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

v. අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී එකවර විෂයයන් 03 කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව හැර) සමත් වීම. (ඉංග්‍රීසි භාෂා දැනුම, තාක්ෂණ දැනුම සහ අ.පො.ස. උසස් පෙළ ජීව විද්‍යා විෂයන් 3 ක් සමත් වූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ).

vi. රාජකාරි ඉටුකිරීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයේ ප්‍රවීණයකු වීම.

vii. මෝටර් වාහන පනතේ (කලින් කලට වෙනස් කළ හැකි පරිදි) රුපියල් 10,000 ක් නොඉක්මවූ දඩයක් නියම කළ හැකි වරදකට හැර වෙනත් කිසිදු අපරාධ වරදකට අධිකරණයකදී වරදකරු වී නොතිබීම.

viii. අධිකරණ විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ කිසියම් තනතුරකින් පහ කරනු නොලැබූ අයකු වීම.

ix. 1951 අංක 17 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කරනු ලබන උපත් හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන් සේවයේ නොයෙදීම.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට රජයේ, පළාත් සභා අරමුදලකින් හෝ පළාත් පාලන ආයතනයක අරමුදලකින් වැටුපක් හෝ දීමනාවක් ලබන තැනැත්තන්ද, රාජ්‍ය සංස්ථා, සමුපකාර සමිතිවල සේවකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් හෝ පළාත් පාලන ආයතනවල සභිකයන්ද, පෞද්ගලික අංශයේ ස්ථිර වැටුපක් ලබන්නන්ද මෙම තනතර සඳහා අයදුම් කිරීමට නුසුදුස්සෝ වෙති.

අඩුපාඩු සහිත අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2026 ජනවාරි මස 9 වැනි දින,**
**කොළඹ 10.**
**අධිකරණ අමාත්‍යාංශයේදී.**

**ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන**
**ලේකම්,**
**අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.**

tamilguru.lk